RARE

# ග්‍රාමීය සංවර්ධනය සඳහා රාජ්‍ය නොවන සංවිධානවල මැදිහත්වීම

(පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇසුරෙන්)

ටී.එම්.එස්.ප්‍රියලාල්

FGS/E/MSSc/2003/09

සමාජීය විද්‍යාපති ආර්ථික විද්‍යාව උපාධියෙහි අවශ්‍යතාවක් පූරණය කරනු පිණිස කැලණිය විශ්ව විද්‍යාලයේ පශ්චාද් උපාධි අධ්‍යයන පීඨය වෙත ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි.

ප්‍රවේශ අංකය: 1262
වර්ග අංකය:

2014 නොවැම්බර්

## සංක්ෂේපය -

සංවර්ධනය යන්න සංවර්ධනය නොවූ රටක ඒකායන අරමුණ වේ. ඒ සඳහා විවිධ රාජ්‍යයන් විසින් නොයෙක් ක්‍රමෝපායන් අනුගමනය කරන අතර, ඒවා එම රටවලට ආවේණික පරිදි සකස් කොට ගෙන ඇත. එක් එක් රටවල පවතින සම්පත්, භූගෝලීය විෂමතා, දේශපාලන දැක්ම වැනි සාධක සංවර්ධනයේ දී වැදගත් දර්ශක වේ. ගෝලීයකරණයත් සමඟ සංවර්ධනය නොවූ රාජ්‍යයයන්වලට ස්වාධීනව නැතහොත් තනි තනිව සංවර්ධනයේ උච්ඡ තත්ත්වයට පත්වීමේ නොහැකියාවක් ඇති බව පැහැදිලි කරුණකි. ඒ සඳහා විවිධ අංශවල සහයෝගය ලබා එම සියලු දේ තුළින් සංවර්ධනය කරා ගමන් කිරීමට කටයුතු කිරීම වර්තමාන ප්‍රවණතාවයි.

ශ්‍රී ලංකාව ගත්විට සංවර්ධනය කරා ප්‍රවේශ වීමට ඇති අවශ්‍යතාව වර්තමානය වනවිට ප්‍රමුඛ වී ඇත. එයට හේතුව නම් වසර තිහකට අධික කාලයක් පැවති යුධමය වාතාවරණය පහව ගොස් නිදහස් සාමකාමී රටක් බිහිව තිබීමයි. එමනිසා නව ප්‍රවණතාව සංවර්ධනයේ නව මානයන් ඔස්සේ ගමන් කිරීමයි. ඒ සඳහා වර්තමාන රජය විසින් කෙටිකාලීන, මධ්‍යකාලීන හා දිගුකාලීන සංවර්ධන වැඩ සටහන් මුළු රටම ආවරණය වන පරිදි ආරම්භ කර ඇත. එසේම තවත් විවිධ සංවර්ධන වැඩ සටහන් සකස් කරමින් පවතී. එම වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රජය සතු අරමුදල් ප්‍රමාණවත් නොවන බැවින් ජාතික හා ජාත්‍යන්තර රටවල් හා සංවිධාන මගින් අරමුදල් සපයා ගැනීමට පෙළඹී ඇත.

ශ්‍රී ලංකාව ගත්කල සංවර්ධනය නාගරික ප්‍රදේශවලට සාපේක්ෂව ග්‍රාමීය ප්‍රදේශවලට පැමිණීමේ ප්‍රමාදයක් දක්නට ලැබේ. එමනිසා සංවර්ධනයේ ප්‍රතිලාභ ග්‍රාමීය අංශයට ගලායෑමට ක්‍රමවේදයන් වැඩි වැඩියෙන් සකස් කළ යුතුව ඇත.

නව සංවර්ධන ඉලක්ක මුදුන් පමුණුවා ගැනීමේ දී රාජ්‍ය අංශය තුළින් මගහැරෙන දර්ශක හා රජයට ඉටු කළ නොහැකි අරමුණු ඉටුකර දීමට ආරම්භ වී ඇති නව සංවිධාන ව්‍යුහයකි රාජ්‍ය නොවන සංවිධාන. ඒවා ප්‍රාදේශීය, ජාතික හා ජාත්‍යන්තර වශයෙන් වර්ග කිරීමට හැක. මෙම සංවිධාන මගින් විවිධ රටවල පවතින සංවර්ධනයේ ඌණතා මගහරවා ගැනීමට අවශ්‍ය පහසුකම් සපයා දෙයි. ශ්‍රී ලංකාවේ ද මෙම වර්ග තුනටම අයත් රාජ්‍ය නොවන සංවිධාන ඔවුන්ගේ විවිධ වූ දැක්ම සහිතව ක්‍රියාත්මක වේ. ඒ අතරින් උතුරු හා නැගෙනහිර පළාත් දෙක සුවිශේෂී වේ. එයට හේතුව නම් වසර තිහක් පුරා යුධමය වාතාවරණයක් පැවතීම නිසා සංවර්ධනයේ අරුණලු පතිත නොවීමයි. වර්තමානය වන විට යුධ වාතාවරණය නිමවීම නිසා සංවර්ධනයේ අරුණලු මුදුන් පමුණුවා ගැනීමට මේ දක්වා ක්‍රියාත්මක වන රාජ්‍ය නොවන සංවිධානවල ක්‍රියාකාරීත්වය සලකා බැලීම කාලීන අවශ්‍යතාවයකි.

අම්පාර දිස්ත්‍රික්කය ගත් විට සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලන අංශයන්ගේ වර්ධනය පහත් මට්ටමක පවතින දිස්ත්‍රික්කයකි. එම අංශ වර්ධනය කර ගැනීම තුළින් සංවර්ධනයේ නව මානයන් ජනිත කරවීමට නව දැක්මක් සහිතව නව වැඩ පිළිවෙළ රාශියක් ක්‍රියාත්මකව පවතී. ඒ කාර්යයන් රාශියෙන් බහුතරයක් රාජ්‍ය නොවන සංවිධාන විසින් ඉටු කිරීම දැකිය හැකිය. එබැවින් මෙම දිස්ත්‍රික්කය පුරා ක්‍රියාත්මක ප්‍රාදේශීය, ජාතික හා ජාත්‍යයන්තර රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ සලකා බැලීම වැදගත් වේ.

අම්පාර දිස්ත්‍රික්කය ගත්විට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස විස්සක් ඇති අතර එයින් පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සිංහල ජනගහනය බහුතරයක් වාසය කරන කොට්ඨාස වලින් එකකි. මෙහි ක්‍රියාත්මක රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව සලකා බලමින් ඒවා තුළින් සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලන අංශයන්හි සිදු වූ වර්ධනය සලකාබැලීම වැදගත් වේ. ඒ ඔස්සේ ග්‍රාමීය ආර්ථික සංවර්ධනයට මෙම ආයතනවලින් සිදු වූ කාර්යය කොතෙක් ද යන්න සවිස්තරාත්මක ව සලකා බැලිය යුතු කරුණකි.